“ස්වර්ගවාසීහු ස්වර්ගයට පිවිසෙන විට අති උත්කෘෂ්ඨ, උත්තරීතර අල්ලාහ්: “මම නුඹලාට යමක් අමතරව දීම නුඹලා ප්රිය කරන්නෙහු ද?”යැයි විමසයි

නබ් (සල්ලල්ලාහු අලෙයිහි ව සල්ලම්) තුමාණන් මෙසේ පැවසු බව සුහෙයිබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: “ස්වර්ගවාසීහු ස්වර්ගයට පිවිසෙන විට අති උත්කෘෂ්ඨ, උත්තරීතර අල්ලාහ්: “මම නුඹලාට යමක් අමතරව දීම නුඹලා ප්රිය කරන්නෙහු
ද?”යැයි විමසයි. එවිට, ඔවුහු: “අපගේ මුහුණු ඔබ සුදුවන් නොකළෙහි ද? අපව ස්වර්ගයට ඇතුළත් නොකළෙහි ද? අපව අපා ගින්නෙන් මුදවා නොගත්තෙහි ද?" යැයි පවසති. පසුව ඔහු
තිරය ඉවත් කරයි. ඔවුනට දෙනු ලැබූ කිසිවක්, ඔවුන්ගේ පරමාධිපති දෙස බැලීමට වඩා ඔවුනට ප්රිය මනාප නොවනු ඇත.”
[صحيح] [رواه مسلم]

ස්වර්ගවාසීහු ස්වර්ගයට පිවිසෙන විට අති උත්කෘෂ්ඨ, උත්තරීතර අල්ලාහ් ඔවුනට මෙසේ පවසන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ප්රකාශ කර සිටියහ. එනම්: මම නුඹලාට යමක් අමතරව පිරිනැමීම නුඹලා ප්රිය කරන්නෙහු ද? එවිට, සමස්ත ස්වර්ගවාසීහු, “අපගේ මුහුණු ඔබ සුදුවන් නොකළෙහි ද? අපව ස්වර්ගයට ඔබ ඇතුළත් නොකළෙහි ද? අපව අපා ගින්නෙන් මුදවා නොගත්තෙහි ද?" යැයි පවසති. පසුව ඔහු බාධකය ඔසවා ඉවත් කරයි. ඔහුගේ ආවරණය ආලෝකයයි. ඔවුනට දෙනු ලැබූ කිසිවක් හෝ වේවා ඔවුන්ගේ පරමාධිපති දෙස බැලීමට වඩා ඔවුනට එය ප්රිය මනාප නොවනු ඇත.

http://sunnah.global/hadeeth/si/show/8344